ශ්‍රී ලංකා නීතිඥ සංගමය
இலங்கை சட்டத்தரணிகள் சங்கம்
BAR ASSOCIATION OF SRI LANKA

*(සිංහල පරිවර්තනය)*

2026 අගෝස්තු 27

**<u>අධිකරණයේ ස්වාධීනත්වය, අධිකරණය පිළිබඳ වගකීම්සහගත විමර්ශනය සහ යුක්තිය පසිඳලීමේ පද්ධතිය පිළිබඳ ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ ප්‍රකාශය</u>**

"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විසිදෙවන සංශෝධනය" යනුවෙන් නම් කර ඇති පනත් කෙටුම්පත මගින් අධිකරණයේ ස්වාධීනත්වය සහ ජනතාවගේ අයිතිවාසිකම් හා යහපත සම්බන්ධයෙන් බරපතළ ගැටලු මතු වන බැවින්, ශ්‍රී ලංකා නීතිඥ සංගමය (BASL) ප්‍රතිපත්තිමය පදනමක් මත එයට විරුද්ධ ස්ථාවරයක් ගෙන ඇත. ඒ අනුව, යෝජිත සංශෝධනයේ ව්‍යවස්ථානුකූලභාවය ශ්‍රී ලංකා නීතිඥ සංගමය විසින් ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ අභියෝගයට ලක් කර ඇත.

මෙම පනත් කෙටුම්පත නීතියක් බවට පත් වුවහොත්, විසිදෙවන සංශෝධනයෙන් ප්‍රතිලාභ ලබන පළමු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරයා වන්නේ ගරු අගවිනිසුරුතුමා බව නිරීක්ෂණය වේ. ඒ අනුව 2026 දෙසැම්බර් 1 වැනි දින අවසන් වීමට නියමිත ගරු අගවිනිසුරුතුමාගේ ධුර කාලය දීර්ඝ කිරීම සඳහා මෙම සංශෝධනය කඩිනමින් ඉදිරියට ගෙන යන බවට පුළුල් මතයක් පවතී.

මෙම පසුබිම තුළ, මෑත කාලයේදී වත්මන් ගරු අගවිනිසුරුතුමා ඇතුළු අධිකරණය සම්බන්ධයෙන් පාර්ලිමේන්තු කටයුතු අතරතුර මෙන්ම සමාජ මාධ්‍ය ඔස්සේ ද විවිධ චෝදනා ඉදිරිපත් වන ආකාරය අපි දැක ඇත්තෙමු.

මෙම කාලසීමාව තුළ ශ්‍රී ලංකා නීතිඥ සංගමය ද සමාජ මාධ්‍ය සහ වෙනත් වේදිකා ඔස්සේ කිසිදු පදනමක් නොමැති ප්‍රහාරවලට ලක්ව ඇත.

මහජන බලය ක්‍රියාත්මක කරන සෑම ආයතනයක් මෙන්ම අධිකරණය ද නීත්‍යානුකූල විමර්ශනයට සහ වගවීමට යටත්ව පැවතිය යුතුය. නඩු තීන්දු, විනිසුරුවරුන්ගේ හැසිරීම සහ යුක්තිය පසිඳලීම සාධාරණ, කරුණු මත පදනම් වූ සහ වගකීම්සහගත විවේචනයට ලක් කළ හැකිය. අගවිනිසුරුවරයා ඇතුළු අධිකරණයේ ඕනෑම විනිසුරුවරයෙකු සම්බන්ධයෙන් විශ්වසනීය කරුණු හෝ චෝදනා මතු වන්නේ නම්, ඒවා වෛෂයිකව විමර්ශනය කර, සාධාරණත්වයට සහ නිසි ක්‍රියාපටිපාටියට ගරු කරමින්, පවතින සුදුසු ව්‍යවස්ථාමය සහ පාර්ලිමේන්තු ක්‍රියාපටිපාටි ඔස්සේ විමර්ශනය කළ යුතුය.

එමෙන්ම, තනි තනි විනිසුරුවරුන්, නීතිඥවරුන් සහ අනෙකුත් පුද්ගලයන් සම්බන්ධයෙන් චෝදනා ඉදිරිපත් කිරීමේදී සියලු දෙනා වගකීමෙන් කටයුතු කළ යුතුය. තහවුරු නොකළ චෝදනා මත පදනම් වූ පුද්ගලික ප්‍රහාර මගින් යුක්තිය පසිඳලීම කෙරෙහි පවතින මහජන විශ්වාසය බිඳ වැටීමටත්, අධිකරණ ක්‍රියාවලියේ සහ සමස්ත යුක්ති පද්ධතියේ ස්වාධීනත්වයට හා අඛණ්ඩතාවට බලපෑම් ඇති වීමටත් ඉඩ ඇත.



President
Rajeev Amarasuriya
Deputy President
Rienzie Arsecularatne PC
Secretary
Nalin De Silva
Treasurer
Pasindu Silva
Assistant Secretary
Lakitha Wakishta Arachchi

No. 153, Mihindu Mawatha, Colombo 12, Sri Lanka.
Telephone : +94 11 2447134, +94 11 2331697, Fax : +94 11 2331697 E-mail : info@basl.lk Web : www.basl.lk

# ශ්‍රී ලංකා නීතිඥ සංගමය

இலங்கை சட்டத்தரணிகள் சங்கம்

# BAR ASSOCIATION OF SRI LANKA


අධිකරණයේ ස්වාධීනත්වය කිසිදු පුද්ගලයකු නීත්‍යානුකූල විමර්ශනයෙන් හෝ වගවීමෙන් ආරක්ෂා කිරීම සඳහා අදහස් කරන ලද්දක් නොවේ. එය ආරවුල් අපක්ෂපාතීව විසඳනු ලබන බවත්, පුද්ගල අයිතිවාසිකම්, නීතියේ ආධිපත්‍යය සහ ව්‍යවස්ථාමය පර්යාය ආරක්ෂා වන බවත් සහතික කරන, ජනතාව වෙනුවෙන් පවතින ආරක්ෂණයකි.

එබැවින්, අධිකරණයේ කාර්යභාරයට සහ යුක්තිය පසිඳලීමේ පද්ධතියට ගරු කරන ලෙසත්, ඒ සමඟම කිසියම් අව්‍යාජ ගැටලුවක් මතු වන්නේ නම් එය සාධාරණව, වගකීම්සහගතව සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා නීතිය මගින් ස්ථාපිත කර ඇති ක්‍රියාපටිපාටි ඔස්සේ ආමන්ත්‍රණය කරන ලෙසත් ශ්‍රී ලංකා නීතිඥ සංගමය රාජ්‍යයේ සියලු අංශවලින්, අදාළ සියලු පාර්ශ්වයන්ගෙන් සහ මාධ්‍යයෙන් ඉල්ලා සිටී.

*අත්සන් කලේ*

| | |
|---|---|
| **රජීව් අමරසූරිය** | **නලින් ද සිල්වා** |
| **සභාපති** | **ලේකම්** |
| **ශ්‍රී ලංකා නීතිඥ සංගමය** | **ශ්‍රී ලංකා නීතිඥ සංගමය** |




President Rajeev Amarasuriya | Deputy President Rienzie Arsecularatne PC | Secretary Nalin De Silva | Treasurer Pasindu Silva | Assistant Secretary Lakitha Wakishta Arachchi

No. 153, Mihindu Mawatha, Colombo 12, Sri Lanka.

Telephone : +94 11 2447134, +94 11 2331697, Fax : +94 11 2331697 E-mail : info@basl.lk Web : www.basl.lk